**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**

**බස් රථවල ගමන් ගන්නා මගීන්, බස්රථ හිමිකරුවන්, බස්රථවල සේවය කරන සේවක කණ්ඩායම් සහ අනෙකුත් සියළුම මහජනතාවගේ දැනගැනීම පිණිසයි**

## <u>අන්තර්වාර බස්ගාස්තු සංශෝධනය</u>

2024 සැප්තැම්බර් මස 01 දින ලංකා සුදු ඩීසල් ලීටර් එකක මිල රු.10 /- කින් අඩුකිරීම හා 2024 ඔක්තෝබර් මස 01 දින සිට (2024 සැප්තැම්බර් 30 දින මධ්‍යම රාත්‍රියේ සිට) ලංකා සුදු ඩීසල් ලීටර් එකක මිල රුපියල් විසිහතරකින් (රු.24 /-) අඩුකිරීම බස්ගාස්තු ගණනය කිරීමේ සූචියට ගැලපූ විට වර්තමානයේ ක්‍රියාත්මක බස්ගාස්තුව සියයට හතරයි දශම දෙකයි හතරකින් ( 4.24 %) අඩු කළ හැකි බව නිරීක්ෂණය වේ.

ඒ අනුව වර්තමානයේ ක්‍රියාත්මක සමාන්‍ය සේවා, අර්ධ සුඛෝපභෝගී සේවා, සුඛෝපභෝගී සේවා, අධි සුඛෝපභෝගී සේවා බස්ගාස්තු 2024 ඔක්තෝබර් මස 01 දින මධ්‍යම රාත්‍රියේ සිට (2024 ඔක්තෝබර් 02 දින 0001 පැයේ සිට) සියයට හතරයි දශම දෙකයි හතරකින් (4.24%) අඩුකිරීමටත්, මෙම ප්‍රතිශතයේ යම්කිසි සංශෝධනයක් වෙතොත් නැවත සමාලෝචනය කිරීමටත් ප්‍රවාහන,මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව 2024 ඔක්තෝබර් 01 දින මධ්‍යම රාත්‍රියේ සිට (2024 ඔක්තෝබර් 02 දින 0001 පැයේ සිට) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ධාවනය කරනු ලබන බස්රථ, ජාතික ගමනාගමන කොමිෂන් සභාව හා පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී විසින් නිකුත් කළ වලංගු මගීසේවා අවසරපත්‍ර යටතේ ධාවනය වන පෞද්ගලික බස්රථ වල නව සංශෝධිත බස්ගාස්තු ක්‍රියාත්මක වන අතර, සංශෝධිත **බස් ගාස්තු චක්‍රය සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක සියළුම අනතර් පළාත් බස් සේවාවල සම්පූර්ණ බස් ගාස්තුව හා ගාස්තු සටහන් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිළ වෙබ් අඩවිය වන** [www.ntc.gov.lk](http://www.ntc.gov.lk) **ඔස්සේ නිරීක්ෂණය කළ / බාගත කරගත හැක.**

ඒ අනුව මගීන්ගෙන් නියමිත බස්ගාස්තුව පමණක් අයකරන ලෙස ශ්‍රී ලංගම සහ සියළුම පෞද්ගලික බස්රථ ධාවකයින් වෙත දැනුම් දෙන අතර නියමිත ගාස්තුවට වඩා වැඩියෙන් බස් ගාස්තු අයකරන අය පිළිබඳව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව ද කාරුණිකව දන්වා සිටිමි.

නියමිත බස්ගාස්තුවට වඩා වැඩියෙන් බස්ගාස්තු අයකළ හොත් අන්තර් පළාත් පෞද්ගලික බස්රථ සම්බන්ධයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 1955 ක්ෂණික දුරකථන අංකයට හෝ 0712595555 වට්ස්ඇප් අංකයටද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සම්බන්ධයෙන් 1958 ක්ෂණික දුරකථන අංකයට හා පළාත් සභා බස්රථ සම්බන්ධයෙන් අදාළ පළාත් අධිකාරීයට පැමිණිලි ඉදිරිපත් කරන ලෙස සියළුම මහජනතාව වෙත දන්වා සිටිමි.

නයෝමි ජයවර්ධන

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික ගමනාගමන කොමිෂන් සභාව